T-13

# ජීව සහ අජීව පරිසරය පිළිබඳ බෞද්ධ විග්‍රහය

කැලණිය විශ්වවිද්‍යාලයේ

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත්උපාධි ආයතනයෙහි

දර්ශනපතිඋපාධි පරීක්ෂණ අවශ්‍යතා ඒකදේශයක් සම්පූර්ණ කිරීම්වස්

ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධයයි.

1995 දෙසැම්බර්

ඩී.ඩී.සේනාධීර

අධීක්ෂක : මහාචාර්ය ඔලිවර් අබේනායක

## සාරාංශය

## ජීව සහ අජීව පරිසරය පිළිබඳ බෞද්ධ විග්‍රහය


මිනිසා සහිත ස්වාභාවික පරිසරය පිළිබඳ ව සදාතනික වටිනාකමකින් යුතු ඉගැන්වීම් රාශියක් බුදු සමයෙහි අන්තර්ගත ව පවතින්නේය යන උපන්‍යාසය පරීක්ෂා කරනු පිණිස කරන ලද පර්යේෂණයක ප්‍රතිඵල මෙම නිබන්ධනය මඟින් ඉදිරිපත් කෙරේ.

මෙහි මුල් පරිච්ඡේදය කැප වී ඇත්තේ පරිසරය පිළිබඳ බෞද්ධ සංකල්පයෙහි දාර්ශනික පදනම සාකච්ඡා කිරීමටය. පරිසරය පිළිබඳ සංකල්පය බෞද්ධ සම්ප්‍රදාය තුළ අර්ථවත් වන ආකාරයත් ස්වාභාවික පරිසරය තුළ මිනිසාට හිමිවන ස්ථානයත් පිළිබඳ ව තුලනාත්මක විග්‍රහයක් කිරීමට මෙහි දී උත්සාහ ගෙන ඇත.

දෙවන පරිච්ඡේදයේ දී අවධානය යොමු කෙරෙන්නේ බුදු සමයෙහි පිළිබිඹු වන ජීවය පිළිබඳ සංකල්පය වෙතය. ජීවය නමැති ප්‍රපංචයෙහි ස්වභාවය පිළිබඳ බෞද්ධ ව්‍යාඛ්‍යානය මතුකර ගනිමින් ජීවයේ පරිණාමය පිළිබඳ ව බුදු සමයෙහි සඳහන් වන තොරතුරු සාකච්ඡා කිරීමත් විවිධ ස්වරූපයන්ගෙන් ප්‍රකට වන ජීවයෙහි පවත්නා ඒකීය ස්වභාවය හඳුනා ගැනීමට උත්සාහ කිරීමත් මෙහි දී සිදුකෙරේ.

තෙවන පරිච්ඡේදයේ දී සාකච්ඡාවට ලක්වන්නේ සත්වලෝකය පිළිබඳ බෞද්ධ ආකල්පයයි. මිනිසා ද සත්ව ලෝකයේ සාමාජිකයකු බවත් මිනිසා සහ සෙසු සත්වයින් අතර පවතින්නේ ප්‍රමාණාත්මක වෙනසක් මිස ගුණාත්මක වෙනසක් නොවන බවත් බුදු සමයෙන් පිළිබිඹු වන බව පෙන්වා දීම මෙහි දී සිදුවෙයි. තව ද මිනිසා වනාහි තවදුරටත් අනුජාතීන්ට බෙදිය නොහැකි එක ම සත්ව විශේෂයක් වන බවට බුදු සමයෙහි දැක්වෙන අදහස සාධාරණීකරණය කිරීමට ද මෙහි දී තැත් දරනු ලැබේ.

සිවුවන පරිච්ඡේදයේ දී ගවේෂණයට ලක්වන්නේ ශාක ලෝකය පිළිබඳ බෞද්ධ ආකල්පයයි. වෘක්ෂලතා ජීව වස්තූන් බව ආදි බුදු සමයට අයත් සූත්‍ර දේශනාවන්ගෙන්

හෙළිවන අයුරු පෙන්වා දෙමින් උද්භිද ලෝකය පිළිබඳ නවීන විද්‍යාත්මක සොයා ගැනීම් මගින් එය සනාථ වන අයුරු සාකච්ඡා කිරීම මෙහි දී සිදුවෙයි. තව ද ශාක ලෝකය විසින් මිනිසා ඇතුළු සෙසු සත්ව ගණයා වෙත ඉටු කෙරෙන අමිල කාර්යභාරය බෞද්ධ චින්තකයින් විසින් මැනැවින් හඳුනාගෙන තිබූ අයුරු සහ බෞද්ධ සදාචාරය සත්ව ලෝකය ඉක්මවා ශාක ලෝකය දක්වා ද පැතිර පවත්නා බව මෙහි දී පෙන්වා දෙයි.

බුදුසමය තුළින් නිස්සාරණය කරගත හැකි පාරිසරික ආචාරධර්ම සමුදාය සම්බන්ධ අධ්‍යයනයක් පස්වැනි පරිච්ඡේදයෙහි අන්තර්ගත ය. වර්තමාන මනුෂ්‍යයා හමුවෙහි පවත්නා පරිසර අර්බුදයට හේතු ප්‍රත්‍යයන් බෞද්ධ දෘෂ්ටිකෝණයෙන් විමසා බැලීමටත් ඒවා වලක්වා ගැනීමෙහි ලා සහ නිරාකරණය කරගැනීමෙහි ලා බෞද්ධ ආචාර ධර්ම උපයෝගී කරගත හැකි ආකාරය පිළිබඳ ව විමර්ශනයෙහි යෙදීමටත් මෙම පරිච්ඡේදය කැපවෙයි. එයට අතිරේක ව බෞද්ධ පාරිසරික ආචාර ධර්ම පිළිබඳ ව පැතිර පවත්නා සාවද්‍ය අර්ථකථන කිහිපයක් විචාරාත්මක ව විමසා බැලීමට ද එහි දී වෙර දැරේ.

බුදුසමයෙහි අන්තර්ගත පරිසරය පිළිබඳ මනෝවිද්‍යාත්මක සහ සෞන්දර්යාත්මක අගැයීම පිළිබඳ විමර්ශනයක් සයවැනි පරිච්ඡේදයේ දී සිදුවෙයි. පුද්ගලයකු වටා පැතිර පවත්නා ස්වාභාවික පරිසරය ඔහුගේ චිත්තක්‍රියාදාමය කෙරෙහි දක්වන මනෝවිද්‍යාත්මක බලපෑම මෙන් ම විවිධ මට්ටමේ ආධ්‍යාත්මික තලවල සිටින පුද්ගලයින් පරිසරය මගින් ලබන සෞන්දර්යාත්මක වින්දනය ද බෞද්ධ මූලග්‍රන්ථ තුළින් පිළිබිඹු වන අයුරු මතුකර ගැනීමට මෙහි දී උත්සාහ කෙරේ.

– – –